රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.07.10

නිවේදන අංකය : 236/2020
නිකුත් කල වේලාව: 09.10

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කර්තෘ

## ප්‍රවෘත්ති නිවේදනය

**මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ කන්දකාඩු** මධ්‍යස්ථානයේ රැඳවියන් සහ කාර්ය මණ්ඩලය බඳුන් කරන ලද **PCR** පරීක්ෂණ 338ක ප්‍රතිඵල මේ වනවිට ලැබී ඇති අතර එයින් නව කොවිඩ් 19 ආසාදිතයන් 196 දෙනකු හඳුනාගෙන ඇත. ඒ අනුව ඊයේ වාර්තා කළ රෝගීන් 56 දෙනාත් සමඟ **මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ කන්දකාඩු** මධ්‍යස්ථානයේ මේ දක්වා වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිතයන් සංඛ්‍යාව 252 කි.

අදාළ **PCR** පරීක්ෂණ මේ වනවිටත් සිදු කෙරමින් පවතින අතර ඒ අනුව **මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ කන්දකාඩු** මධ්‍යස්ථානයේ තවදුරටත් ආසාදිතයන් වාර්තා වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන බව **සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සඳහන් කරයි.**

එසේම අදාළ කාලය තුළදී **මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ කන්දකාඩු** මධ්‍යස්ථානයෙන්, පුනරුත්ථාපනය අවසන් කර පිටතට යවන ලද රැඳවියන් සහ ආශ්‍රිතයන්ද හඳුනාගනිමින් **PCR** පරීක්ෂණ සහ නිරෝධායන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇති අතර ඒ අනුව මෙම ස්ථානයෙන් සමාජය තුළට කොවිඩ් 19 පැතිර යාම වැළැක්වීමට සියලු පියවර ගනිමින් පවතී.

නාලක කළුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ t (+94 11) 2515759
ෆැ பெ f (+94 11) 2514753
infodept@slt.lk
www.news.lk